# 08 වෙස්මුහුණක් හදමු

ටීචර්, ටීචර්, අපි වෙස්මුහුණ හදන්න

බඩු ගෙනාවා.

ආ... බොහොම හොඳයි.

එහෙනම් අපි වෙස්මුහුණ හදන්න පටන් ගනිමු.

හරි ටීචර්, අපි ලෑස්ති යි.



ඉස්සෙල්ලා ම හතරැස් සනකම කඩදාසි කොළයක් ගන්න.



මුහුණේ ප්‍රමාණයට කැල්ලක්

කපා ගන්න.

දැන් කොළය හතරට නවන්න.



කොළේ හරි මැද

පැනකින් ලකුණු කරන්න.

දැන් හරි මැද සිට

දෙපැත්තට අඟල් බාගය බැගින්

හරහට ඉරක් අඳින්න.

ඉහළටත් අඟල් දෙකක්

ලකුණු කරගන්න.



ත්‍රිකෝණයක් වගේ

යා කරන්න.

මේ තියෙන්නේ නාසය.

ත්‍රිකෝණයේ ඉහළ දෙපැත්තේ ඇස් දෙක ඇඳ ගන්න.

නාසයට පහළින් කට ඇඳ ගන්න. මෙන්න මෙහෙම

නාසය පහළ සිට ඉහළට වටේට **කපන්න.**

ඇස් දෙක ළඟින් වෙන් කරන්න එපා.

කැපූ කෑල්ල මුහුණෙන් අයින් කරන්න එපා.

දන් වටේට රවුමක් වෙන්න මුහුණක් ඇඳ ගන්න.



කන් දෙකක් ඇඳ ගන්න.

මෙන්න මෙහෙම

රැවුලක් ඇඳගන්න.

ඇස්, දෙක කෙළවර

සිදුරු කර ගන්න.

දන් නූලක් නැත්තම්

රබර් පටියක්

අරගන්න.

සිදුරු දෙකට දාන්න. දෙපැත්තෙන් ගැට ගහන්න.

ලස්සනට පාට කරන්න.

අනේ ලස්සන වෙස්මුහුණක්!

දමු දමු .......... ලස්සන යි!

# වචන මාලාව

| | |
|---|---|
| අපි | - நாங்கள் |
| හදන්න | - செய்யுங்கள் |
| කොළය | - கடதாசி |
| මුහුණේ | - முகத்தில் |
| නවන්න | - மடியுங்கள் |
| මැද | - நடுவில் |
| ත්‍රිකෝණයක් | - முக்கோணம் |
| කපන්න | - வெட்டுங்கள் |
| රවුමක් | - வட்டம் |
| දෙකක් | - இரண்டு |
| සිදුරු | - புள்ளி |
| නූලක් | - நூல் |

## ක්‍රියාකාරකම 01

යා කරමු. කියවමු.
படங்களை இணைப்போம்.

1. රවුම්
2. හතරැස්
3. ත්‍රිකෝණය
4. හරහට
5. ඉහළට
6. පහළට



## ක්‍රියාකාරකම 02

**පිළිවෙළට ගළපමු. කියමු. කොටුවල අංක ලියමු.**
**ஒழுங்குபடுத்துவோம், கூறுவோம், கட்டத்துக்குள் இலக்கம் இடுவோம்.**

1. මුහුණේ ප්‍රමාණයට කැල්ලක් කපා ගන්න. ☐
2. කොළය හරි මැද පැනකින් ලකුණු කරන්න. ☐
3. හරි මැද සිට දෙපැත්තට ඉරක් අඳින්න. ☐
4. නාසයට ඉහළින් දෙපැත්තේ ඇස් දෙක අඳින්න. ☐
5. නාසයට පහළින් කට අඳින්න. ☐
6. කොළය හතරට නවන්න. ☐
7. කඩදාසි කොළයක් ගන්න. ☐

## ක්‍රියාකාරකම 03

**වෙස්මුහුණ සෑදීමට වුවමනා දේවල් කියමු. ලියමු.**
**முகமூடி தாயரிப்பதற்கு தேவையான பொருட்கள் கூறுவோம், எழுதுவோம்.**

1. ....................................
2. ....................................
3. ....................................
4. ....................................
5. ....................................











## ක්‍රියාකාරකම 04

**සොයමු. කියමු. ලියමු.**

தேடுவோம், சொல்வோம், எழுதுவோம்.

1. ළමයින් සෑදීමට සූදනම් වන්නේ කුමක් ද? ......................
2. ත්‍රිකෝණයක් වගේ තියෙන්නේ කුමක් ද? .........................
3. ත්‍රිකෝණයේ ඉහළ දෙපැත්තේ ඇන්දේ මොනවා ද? ......
4. කන් දෙකට ගැට ගසන්නේ මොනවා ද? ..........................
5. වෙස්මුහුණේ නාසය හා කට අතර ඇත්තේ කුමක් ද?

   ..................................................................

## ක්‍රියාකාරකම 05

**මේ වචන උදවු කර ගෙන ඔරලෝසුවක් සාදන ආකාරය කියන්න.**

பின்வரும் சொற்களின் உதவியுடன் கடிகாரம் செய்யும் முறையை விளக்குங்கள்

දොළහකට | හරි මැද | රවුමක් | කොට කටුව | කාඩ්බෝඩ් | මැද | ඉලක්කම්

1. .............................. කැල්ලක් ගන්න.
2. ............................... කපා ගන්න.
3. ............................... ලකුණු කරන්න.
4. රවුම වටේට කොටස් .................. බෙදන්න.
5. 1 සිට 12 දක්වා ...................... ලියන්න.
6. හරි .................... කටු දෙක සවි කරන්න.